# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව

## මාධ්‍ය නිවේදනය

2016.02.14 වන දින

2016 ජනවාරි මස දින 05ක් පුරා මහජන අදහස් විමසීමේ රැස්වීම් පැවැත්වීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව විසින් පෙබරවාරි මස අනෙකුත් දිස්ත්‍රික්කවල මහජන අදහස් විමසීමේ රැස්වීම් පැවැත්වීම ආරම්භ කරන ලදි. මේ වන විට ගම්පහ, මාතලේ, කලුතර, නුවර, වව්නියාව,කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල මහජන අදහස් විමසීමේ රැස්වීම් පවත්වා ඇත. ඊළඟ සති දෙක තුළදී කමිටු සාමාජිකයින් විසින් අනෙකුත් දිස්ත්‍රික්ක වලද මහජන අදහස් විමසීමේ රැස්වීම් පවත්වනු ඇත. (අදාළ වැඩ සටහන් විස්තරය අමුණා ඇත)

මහජනතාව විසින් ඉතා උද්යෝගිමත් අයුරින් මේ සඳහා ප්‍රතිචාර දක්වන ලදි. සෑම දිස්ත්‍රික්කයකදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව මෙන්ම රටේ පාලන කටයුතු හා සම්බන්ධ ගැටලු පිළිබඳව ද මහජනයා විසින් සිය යෝජනා ඉදිරිපත් කරන ලදි. මෙමගින් මහජනතාවගේ මූලික අපේක්ෂා, විශේෂයෙන් රජය හා පුරවැසියන් අතර පවත්නා සම්බන්ධතාවය, මහජනයා විසින් දකින ආකාරය පිළිබඳව කමිටුවට අවබෝධයක් ලබා ගැනීමේ අවස්ථා සැලසෙන නිසා එම මහජන අදහස් ඉතා වැදගත් වේ. මහජන නියෝජිතයින් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ අදහස් බාධාවකින් තොරව ප්‍රකාශ කිරීමට කමිටුව විසින් ඔවුන් හට අවස්ථාව ලබාදෙයි.

මෙම රැස්වීම් මහජනතාව සඳහා විවෘත බැවින්, මාධ්‍යවේදීන් ඇතුලු බොහෝ පිරිසකට මෙම කාර්යය නිරීක්ෂණය කිරීමේ අවස්ථාව සැලසී ඇත. මෙම රැස්වීම්වලදී මහජනයා විසින් දක්වනු ලබන ප්‍රතිචාර, ඔවුන්ගේ ඉවසිලිවන්තභාවය, අනුග්‍රහය හා දේශපාලන පරිනතභාවය පිළිබඳව අපි ඔවුනට කෘතඥ වන්නෙමු. සමහර අවස්ථාවල ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ඉතා දිගු කාලයක් බලාසිටින්නටත්, අන්

අයගේ අදහස් වලට ඇහුම්කන් දීමටත්, ඔවුන්ට සිදුවිය. මෙය, අප රටේ මිනිසුන් තුළ පවත්නා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හැඟීමේ ශක්තිමත්භාවය පෙන්නුම් කරනු ලබන ප්‍රබල සාධකයක් බව අපගේ හැඟීමයි. අප වෙත පැවරී ඇති ප්‍රධාන කර්තව්‍ය වන්නේ, මහජනතාවට ප්‍රකාශ කිරීමට ඇති කරුණු වලට සවන් දී ඒ පිළිබඳව අවධානය යොමු කර ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු මත පදනම්ව සකස් කරන ලද අපගේ නිර්දේශ සහිත වාර්තාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත ලබාදීමයි.

මහජන අදහස් විමසීමේ රැස්වීම් වලදී ඊට වාචිකව ඉදිරිපත් කරන ලද කරුණු වලට අමතරව, සමාජ මාධ්‍ය හරහා ඉදිරිපත් කරන ලද විවිධාකාර ලිඛිත කරුණු ද කමිටුව වෙත ලැබේ. ලිඛිත කරුණු ලබදීම සඳහා වන අවසන් දිනය 2016 මාර්තු 10 දින දක්වා දීර්ඝ කරන ලදි. මෙතෙක් මහජනතාව වෙතින් ලැබුණ ඉමහත් ප්‍රතිචාර හේතුවෙන් කොළඹ මෙන්ම තෝරාගත් අනෙකුත් දිස්ත්‍රික්කයන්හී දිද, මාර්තු මසදී මහජන අදහස් විමසීමේ රැස්වීම් වාර කිහිපයක් පැවැත්වීමට ද කමිටුව විසින් සැලසුම් කර ඇත. ඒ අනුව, 2016 මාර්තු මස 03, 04 සහ 05 යන දිනයන්හී දි කොළඹ දිස්ත්‍රික්කය සඳහා මහජන අදහස් විමසීමේ රැස්වීම් පැවැත්වීමට තීරණය කර ඇත. මෙම කමිටුව, මාර්තු මාසයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ ප්‍රවීණයින්, දේශපාලන නායකයින්, බුද්ධිමතුන්, ආගමික නායකයින් සහ සිවිල් සමාජයේ සාමාජිකයින් ද හමුවී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ ඔවුන්ගේ අදහස් ලබාගනු ඇත. මෙතෙක් ලැබී ඇති මහජන අදහස් විශ්ලේෂණය කර ඒවා වර්ගීකරණය කිරීමේ කටයුත්ත මේවන විටත් කමිටුව විසින් ආරම්භ කර ඇත.

අනෙකුත් දිස්ත්‍රික්ක වල පැවැත්වීමට නියමිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ රැස්වීම් වලට ක්‍රියාශීලීව සහභාගී වන ලෙස කමිටුව විසින් මහජනයාට ආරාධනය කරනු ලබයි. මෙම කාර්යයේදි මාධ්‍ය විසින් දක්වන ලද නොමසුරු සහයෝගය වෙනුවෙන් කමිටුව සිය ස්තූතිය පුද කර සිටින අතර, මහජන අදහස් ඉදිරිපත් කිරීමේදි, එම අදහස් වල මූලික හරය පිළිබඳව සිය අවධානය යොමු කරමින් ඒවා දැඩි උනන්දුවකින් වාර්තා කිරීම සම්බන්ධයෙන් සිය

කෘතඥතාව පලකර සිටියි. මෙය, ශ්‍රී ලාංකික පුරවැසියන් හට එහි උත්තරීතර නීතිය සකස් කිරීමේ කටයුත්තට දායකවීම උදෙසා ලැබුණ අනගි අවස්ථාවක් වන අතර, ඉන් උපරිම ඵල නෙලා ගත යුතුව ඇත.